**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2017**

---

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 මාර්තු 23 දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය ව්‍යාචනය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනිමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

යෝජනා ක්‍රමයේ සමාලෝචිත වර්ෂය අවසානයට ධීවර විශ්‍රාම වැටුප් වගකීම රු.3,297,559,198 ක් වූ අතර එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 8.8 ක වැඩි වීමකි. එසේම යෝජනා ක්‍රමයේ ධීවර විශ්‍රාම වැටුප් අරමුදල රු.2,656,607,635 ක සෘණ අගයක් වී තිබුණි. ඒ සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 අනුව 2007 වර්ෂයේ සිට සිදුකරනු ලබන ආයුගණක තක්සේරුව හා නව ධීවරයින් සාමාජිකත්වය ලබාගැනීමට සාපේක්ෂව ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම ඉහළ මට්ටමක පැවතීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ඒ අනුව මෙම අහිතකර මූල්‍ය තත්ත්වය ඉදිරියේදී තවදුරටත් වර්ධනය විය හැකි බැවින්ද මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ප්‍රතිඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවට ආයතනය විසින් තහවරු කර නොමැති බැවින්ද යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

2017 දෙසැම්බර් 31 දිනට රු.663,955,406 ක් වූ ලැබිය යුතු ණය ශේෂය ප්‍රමිතයේ 64 ඡේදය ප්‍රකාරව ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

ප්‍රමිතයේ 59 ඡේදය ප්‍රකාරව සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් සඳහාම සමාලෝචනය කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව එය සිදුකර නොතිබුණි. ඒ අනුව විශ්‍රාම වැටුප් වගකීම සඳහා වෙන්කිරීමේ දී ඒ සඳහා සැලකිය යුතු බලපෑමක් කළ හැකි පොළී අනුපාතය, බඳවා ගැනීම්, ඉවත්වීම්, මරණ, අබලතාවයන් වැනි මූලික සංරචකයන් සහ සක්‍රිය දායකයන්ගේ සහ ධීවර විශ්‍රාමිකයන්ගේ වෙනස්වීම් කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබීම හේතුවෙන් 2007 වර්ෂයේදී 54,248 ක් වූ සක්‍රීය දායකයන් හා විශ්‍රාමලාභීන් සංඛ්‍යාව 2017 වර්ෂයේදී 29,472 ක් දක්වා එනම් සියයට 46 කින් අඩුවී තිබූ නමුත් එම කාලයට අදාළ ප්‍රතිපාදනය රු.1,242,006,539 සිට රු.3,297,559,198 දක්වා එනම් සියයට 166 කින් වැඩිවී තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්.

යෝජනා ක්‍රමය මගින් ගොවි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ලබා දී තිබූ රු.518,000,000 ක ණය සහ ඒ මත අයකරන රු.330,905,406 ක් වූ ණය පොලිය ආදි කොන්දේසි ඇතුළත් ගිවිසුම විගණනයට ඉදිරිපත් කිරීමට ආයතනය අපොහොසත් වූ අතර ඒ හේතුවෙන් එම ගනුදෙනුවේ නිවැරදිභාවය හා සම්පූර්ණත්වය තහවුරු කර ගැනීමට නොහැකි විය .

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,417,697 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු නිරවුල් කිරීමෙන් තොරව 1998 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ආ) ගෙවිය යුතු මුද්‍රණ වියදම් සඳහා වාර්ෂිකව වෙන් කර තිබූ එකතුව රු.515,000 ක් වූ මුදල නිරවුල් කිරීමෙන් තොරව 2011 වර්ෂයේ සිට ගිණුම්වල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ සිට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා අවස්ථා කිහිපයක දී ලබා දී තිබූ ණය සඳහා 2017 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.663,955,406 ක් වූ ණය සහ පොලිය අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

**2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| **(අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත** | |
| (i) 16 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව සාමාජික ගාස්තු ගෙවීම පැහැර හරින ලද සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් අවලංගු වූ සාමාජිකත්වය නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති අයිතිය ද අහිමි වී තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතුවලින් රු.28,891,442 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,420,592 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,470,850 ක එනම් සියයට 1094 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ලංකා බැංකුවට එරෙහිව පවරා තිබූ නඩුවක් මණ්ඩලයට වාසි සහගත ලෙස තීරණය වීමෙන් ලැබිය යුතුව තිබූ මුදලින් කොටසක් වන රු.37,672,911 ක් මණ්ඩලයට ලැබීම ඉහත අතිරික්තය ඇති වීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,194,196 ක අතිරික්තයක් ඇති වී තිබූ නමුත් 2014 හා 2015 වර්ෂවල දී එය ක්‍රමයෙන් පිරිහී තිබූ අතර පිළිවෙලින් රු. 7,170,305 ක හා රු.15,147,293 ක ඌනතාවයක් ඇති වී තිබුණි. එහෙත් 2016 හා 2017 වර්ෂවලදී නැවතත් අතිරික්තයක් ඇති වී තිබූ අතර එය 2017 වර්ෂයේ දී රු.28,891,442 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද ඉහත මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේ දී 2013 වර්ෂයේ රු.14,622,327 ක් වූ දායකත්වය 2014 හා 2015 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. 4,358,373 ක හා රු.11,983,314 ක සෘණ අගයක් දක්වා පිරිහී තිබූ නමුත් 2016 හා 2017 වර්ෂයන්හිදී නැවතත් පිළිවෙලින් රු.5,601,658 ක් හා රු.32,281,870 ක් දක්වා යෝජනා ක්‍රමයේ දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2017 | 2016 | වෙනස්වීම වැඩිවීම / (අඩුවීම) |
|---|---|---|---|
| | රු. | රු. | % |
| <u>ආදායම</u> | | | |
| පොලී ආදායම | 58,753,600 | 63,046,648 | (7) |
| ධීවරයින්ගේ දායක මුදල | 920,022 | 928,732 | (1) |
| පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන | 1,500,000 | 1,500,000 | - |
| වෙනත් ආදායම් | 37,672,912 | | 100 |
| **මුළු ආදායම** | **98,846,534** | **65,475,380** | 51 |
| <u>අඩුකලා - වියදම්</u> | | | |
| විශ්‍රාම ගෙවීම් | (59,897,422) | (53,821,700) | 11 |
| වෙනත් මෙහෙයුම් වියදම් | (3,865,686) | (4,148,448) | (7) |
| පරිපාලන හා මූල්‍ය වියදම් | (6,191,984) | (5,084,640) | 22 |
| **මුළු වියදම** | **(69,955,092)** | **(63,054,788)** | 11 |
| **වර්ෂය සඳහා ලාභය (පාඩුව)** | **28,891,442** | **2,420,592** | |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මුළු දායකය රු.920,022 ක් වූ නමුත් මුළු විශ්‍රාම වැටුප් ගෙවීම් රු.59,897,422 ක්, ශුද්ධ වාරික ගෙවීම් රු.1,354,615 ක් හා මරණ බෙලහීන ප්‍රතිලාභ ගෙවීම රු.463,800 ක් වූයෙන් දායකය ඉක්මවා ගෙවීම් රු.60,795,815 ක් හෙවත් සියයට 6,608 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ ධීවරයින්ගේ දායක මුදල් සියයට එකකින් අඩු වී ඇති අතර මුළු විශ්‍රාම වැටුප් ගෙවීම් සියයට 11 කින් ද විශ්‍රාම වැටුප් වගකීම සියයට 8.8 කින් ද වැඩි වී තිබුණි.

(ආ) යෝජනා ක්‍රමයේ ප්‍රධාන ආදායම ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ දායක මුදල විය යුතු වුවත් ප්‍රධාන ආදායම, සමාලෝචිත වර්ෂයේදී පොලී ආදායමින් සියයට 55 ක් එනම් රු.54,394,779 ක් ගොවි යෝජනා ක්‍රමය වෙත ලබාදී තිබුණු ණය මත අයකල පොලී ආදායමින් සමන්විත වී තිබුණි.

(ඇ) අයවැය ඇස්තමේන්තු අනුව සමාලෝචිත වර්ෂය තුළදී යෝජනා ක්‍රමයට නව දායකයින් 100 ක් බඳවා ගැනීමට ඇස්තමේන්තු කළ ද දායකයින් 109 දෙනෙක් බඳවා ගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය තුළදී දායකයින් 144 දෙනෙකු යෝජනා ක්‍රමයෙන් ඉවත් වී තිබුණි.

## 3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධීන්

---

මණ්ඩලය විසින් 1996 වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද ආයෝජනයන් කල්පිරීමේදී ලංකා බැංකුව වරදවා කටයුතු කිරීම මත ධීවර විශ්‍රාම වැටුප් අරමුදලට අහිමි වූ පොළිය අය කර ගැනීම සඳහා එම බැංකුවට එරෙහිව මණ්ඩලය විසින් නඩු පවරා තිබුණි. ඒ සඳහා 2003 ඔක්තෝබර් 07 දින නඩු ගාස්තුවද ඇතුලත්ව අහිමි වූ පොළිය හා මුදල් මණ්ඩලයට ලබාදීමට දිසා අධිකරණය විසින් ලබාදුන් තීන්දුවම 2015 අගෝස්තු 14 දින අභියාචනාධිකරණය මගින්ද ලබා දී තිබුණි. මණ්ඩලයේ ගණනය කිරීමට අනුව, 2017 මාර්තු 31 දිනට ලංකා බැංකුවෙන් ලැබිය යුතු මුදල රු.103,248,251 ක් ව පැවතුන අතර 2017 පෙබරවාරි 17 දින රු.31,618,396 ක් හා 2017 අප්‍රේල් 07 වන දින රු.6,054,515 ක් ලෙස එකතුව රු.37,672,911 ක් පමණක් බැංකුව විසින් ගෙවා තිබුණි. දෙන ලද තීන්දුව ක්‍රියාත්මක කරවා ගැනීමට කළමනාකරණය ප්‍රමාද වීම හා කාලීනව අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඉතිරි මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් නැවතත් 2017 ජූලි 25 දින ආයතනය විසින් ලංකා බැංකුවට එරෙහිව නඩු පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

## 4.1 කාර්යසාධනය

---

ධීවරයින්ගේ මහලු වයසේ දී හෝ දුබලතාවයක දී ධීවරයන්ට සමාජ ආරක්ෂණය සැලසීම, ධීවරයකු මියගිය විට එම ධීවරයාගේ යැපෙන්නන්ට සහන සැලසීම, තම ජීවනෝපායෙහි දිගටම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරවීම, තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම, ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉටු කිරීම පිණිස ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ස්ථාපිත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 – 2016 සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේ දී 2014 වර්ෂයෙන් පසු අරමුදල ක්ෂය වන තත්ත්වයක් ආරම්භ වී 2020 දී එය ශූන්‍ය වන තත්ත්වයක් පවතින බැවින් එය ප්‍රතිසංවිධානය කළ යුතු බව කළමනාකරණය විසින් හඳුනාගෙන වර්ෂ 03 ක් ඉක්ම ගොස් තිබුනද කිසිදු ප්‍රතිසංවිධාන කටයුත්තක් සිදු කිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) තම ජීවනෝපායෙහි දිගට ම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරවීම, තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම, ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉටු කිරීම සම්බන්ධයෙන් යෝජනා ක්‍රමයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දායකයින්ගෙන් රු.3,684,000 ක දායක මුදල් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණද, තථ්‍ය දායක මුදල් ලැබීම් රු.920,022 ක් පමණක් විය.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

දායක ප්‍රතිලාභ ගෙවීම ප්‍රමාද වීම, ධීවරයින් යෝජනා ක්‍රමයෙන් අපේක්ෂා කළ ප්‍රතිලාභ අනපේක්ෂිතව අහිමි වීම, දායකයින් පිළිබඳ තොරතුරු යාවත්කාලීන නොවීම, බඳවා ගැනීම ක්‍රමයෙන් හීන වීම තුලින් කර්මාන්තය තුළට යොමු කරවීමේ අඩු ප්‍රවණතාව හා ඉතිරි කිරීමේ පුරුද්ද අහිමි වී යාම යනාදිය හේතුවෙන් ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් ධීවර ජනතාවට ලබා දිය යුතු සේවාව කාර්යක්ෂමව, ඵලදායීව හා අපේක්ෂා කළ පරිදි ඉටුනොවීමේ තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 34 සිට සියයට110 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ අංක 01 /2014 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. අරමුදලේ පැවැත්ම කෙරෙහි අවිනිශ්චිත තත්ත්වයක් ඇතිවෙමින් තිබියදීත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල නොකිරීමෙන් ඇතිවිය හැකි තත්ත්වයට මුහුණ දීමට ආයතනය තුළ කිසිදු සූදානමක් හෝ සැලැස්මක් නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | දායක මුදල් කළමනාකරණය | ගෙවීමට යවන ලද විශ්‍රාම වැටුප් වලින් නොගෙවා ඉතිරිවන මුදල් කාලීනව නැවත ගෙන්වා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) | කළමනාකරණ තොරතුරු පද්ධතිය | (i) ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාල හරහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර විශ්‍රාම වැටුප් අංශය තුළ ලේඛණගත නොකරන බැවින් වර්ෂය තුල ලද ඉල්ලුම් පත්‍ර ප්‍රමාණය, දැනට පිළියෙල කර ඇති ප්‍රමාණය, පිළියෙල කිරීමට ඇති ප්‍රමාණය පහසුවෙන් හඳුනාගත හැකි ක්‍රමවේදයක් නොතිබීම. |
| | | (ii) තොරතුරු ලේඛණගත නොකිරීම හේතුවෙන් වර්ෂය තුළ ලද සමස්ත ඉල්ලුම් පත්‍ර ප්‍රමාණය අතුරින් විශ්‍රාම වැටුප් ගෙවීම, ශුද්ධ වාරික ගෙවීම්, මරණ හා බෙලහීන පාරිතෝෂිත ගෙවීම් ලෙස වෙන් කර ඇති ප්‍රමාණයන් පහසුවෙන් හඳුනා ගෙන ඒ පිළිබඳ විශ්ලේෂණය කිරීමට නොහැකි වීම. |
| | | (iii) ජීව දත්ත තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන නොයාම. |